## ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

## Master of Arts Degree in Economics

# ශිෂ්‍ය අත්පොත

# Student HandBook

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර


ECONOMY
BUSINESS
CONCEPT
DIAGRAM
MONEY
FINANCE
MARKET
WEALTH
DESIGN
SAVINGS
CASH
CURRENCY
OFFICE
BANKING
SYMBOL
HUMAN
SAVE
CRISIS
EARNINGS
ECONOMIC
RESOURCES
PROGRESS
INVESTMENT
GRAPH
REPORT
SUCCESS
PROFIT
CHART
GROWTH
ACCOUNTING
FINANCIAL
ANNUAL
MODERN
COMMERCE
ENVIRONMENT
ARROW
PLAN
CREDITCITY
INDEX
IMPROVEMENT
DOCUMENT
PAPER
COIN
HAND
PEN
TRADE
JOB
MALE
PART

# 1. හැඳින්වීම

## 1.1 රුහුණ විශ්වවිද්‍යාලය

1972 අංක 1 දරණ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ පිහිටුවා තිබුණු ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ මණ්ඩපයක් වශයෙන් 1978 අගෝස්තු මස 28 වැනි දින මාතර මණ්ඩපය ආරම්භ කරන ලදි. 1979 දී, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත ක්‍රියාත්මක වීමෙන් පසු එකී විධිවිධාන යටතේ මෙතෙක් එක් විශ්වවිද්‍යාලයක් යටතේ පැවති මණ්ඩප සියල්ලම ස්වාධීන විශ්වවිද්‍යාල බවට පත් වූහ. ඒ අනුව මාතර මණ්ඩපය 1979 ජනවාරි මස 01 වැනි දින සිට "රුහුණ විශ්වවිද්‍යාල විද්‍යායතනය" නමින් විද්‍යායතනයක් වශයෙන් ස්ථාපිත විය. ආරම්භයේදී මෙම විශ්වවිද්‍යාල විද්‍යායතනය, කලා පීඨය, වෛද්‍ය පීඨය, කෘෂිකර්ම පීඨය සහ විද්‍යා පීඨය වශයෙන් පීඨ 04 කින් ආරම්භ වූ අතර කලා පීඨය හා විද්‍යා පීඨය මාතර වැල්ලමඩමේත්, කෘෂිකර්ම පීඨය කඹුරුපිටිය මාපලානේත්, වෛද්‍ය පීඨය ගාල්ල කරාපිටියේත් පිහිටුවන ලදි. 1979 සිට විද්‍යායතනය වශයෙන් පවත්වා ගෙන යනු ලැබූ රුහුණ විශ්වවිද්‍යාල විද්‍යායතනය 1984 පෙබරවාරි මස 01 වැනි දින සිට "රුහුණ විශ්වවිද්‍යාලය" නමින් අංග සම්පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත්විය.

රුහුණ විශ්වවිද්‍යාලයේ පරිපාලන මූලස්ථානය මාතර වැල්ලමඩමෙහි පිහිටුවන ලද අතර එහි අක්කර 70 කට වඩා

විශාල වූ බිම් ප්‍රමාණයක ප්‍රධාන පරිපාලන සංකීර්ණයත්, විද්‍යා, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයත් ස්ථාපනය විය. රුහුණ විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි සංකීර්ණයේ ගෘහ නිර්මාණ කටයුතු කරන ලද්දේ ලෝක ප්‍රසිද්ධ ගෘහ නිර්මාණ ශිල්පියකු වන ජෙෆ්රි බාවා මහතා විසිනි. ගොඩනැගිලි ඉදිකිරීම් හා පොදු පහසුකම් සපුරා ලීම නෙදර්ලන්තයේ බැලස්ට් නීඩම් සමාගම විසින් ඉටු කරන ලදී. රුපියල් මිලියන 900ක පමණ වියදමින් ගොඩනගන ලද මෙකී ගොඩනැගිලි සංකීර්ණය සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ශ්‍රී ලංකා රජය මගින් පමණක් ලබාදීම ද සුවිශේෂ විය.

රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය 2000 වසරේදී ගාල්ල හපුගල ප්‍රදේශයේ ආරම්භ කළ අතර 2003 වසරේදී මූල්‍ය හා කළමණාකරණ පීඨයද, 2006 වසරේදී ධීවර සහ සාගර විද්‍යා හා තාක්‍ෂණ පීඨයද මාතර වැල්ලමඩම පරිශ්‍රය තුළම ආරම්භ කර ඇත. 2011 වසරේ නොවැම්බර් මාසයේදී පශ්චාද් උපාධි පීඨය ආරම්භ කිරීමත් සමග රුහුණ විශ්වවිද්‍යාලයේ පීඨ සංඛ්‍යාව 10 දක්වා වැඩි විය. දැනට රුහුණ විශ්වවිද්‍යාලයේ සිසුහු 8000 ක පමණ පිරිසක් ප්‍රථම සහ පශ්චාද් උපාධි සඳහා අධ්‍යයන කටයුතුවල නියැළී සිටිති.

# රුහුණ විශ්වවිද්‍යාලයේ දැක්ම හා මෙහෙවර

## රුහුණ විශ්වවිද්‍යාලයේ දැක්ම

***Vision of the University of Ruhuna***

දැයේ ප්‍රමුඛතම බුද්ධිමය කේන්ද්‍රස්ථානය බවට පත්වීම

To be the prime intellectual thrust of the nation

## රුහුණ විශ්වවිද්‍යාලයේ මෙහෙවර

***Mission of the University of Ruhuna***

ඉගැන්වීම්, පර්යේෂණ සහ සේවා මගින් සමාජයට සේවය
කිරීම පිණිස දැනුම හා කුසලතා වර්ධනය කිරීම

To advance knowledge and skills through teaching,
research and services to serve the society

# රුහුණ විශ්වවිද්‍යාලයීය ගීතය

බබලන සිරි ලක දකුණේ
විරුවන් බිහි කළ දෙරණේ
පඬුවන් වොරදුණු පොරණේ
සරසවියයි මේ රුහුණේ

විද්‍යා ශිල්ප කලා නැණ හරවත්
ලබමින් දන මන කරමින් පැණවත්
දෙස බස රැස සුරකින ඔද තෙදවත්
මිනිසුන් වෙමු ලෝ පසසන ගුණවත්

යුක්තිය ශක්තිය බව නිති සිහි කර
දෑ ගොත් කුල මල පටු මත බිඳ හැර
නම රැක පරසිඳු රෝහණ පුරවර
හිරු සඳු වෙමු ලක් සරසවි නිල බර

ගී පද මාලා ඃ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න


තනු නිර්මාණය සහ සංගීතය ඃ ආචාර්ය පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේව

## 2. ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව හැඳින්වීම

රුහුණ විශ්වවිද්‍යාලයේ, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය යටතේ ආර්ථික විද්‍යා පිළිබඳ එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහාත් පශ්චාද් උපාධි අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම හා පරීක්ෂණ පැවැත්වීම හා උපාධි ප්‍රදානය 2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

2011 වර්ෂයේ පශ්චාද් උපාධි පීඨය පිහිටුවීමත් සමග උක්ත පාඨමාලාව සඳහා පශ්චාද් උපාධි අපේක්ෂකයින් ලියාපදිංචි කිරීමේ සිට අදාළ උපාධිය පිරිනැමීම දක්වා වූ සියළු කටයුතු අදාළ රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙනයාම රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨයේ අධීක්ෂණය යටතේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය මගින් සිදු කරනු ලැබේ.

මෙම ප්‍රකාශයේ සඳහන් කරුණු පූර්ව දැනුම් දීමකින් තොරව සංශෝධනය කිරීමේ හෝ වෙනස් කිරීමේ අයිතිය රුහුණ විශ්වවිද්‍යාලය සතුවේ.




## 3. උපාධි පාඨමාලාවේ නාමය

ආර්ථික විද්‍යාව පිළිබඳ එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

One Year Master of Arts Degree in Economics

# 4. පසුබිම හා තාර්කික බව

රටක සංවර්ධන ක්‍රියාවලිය කාර්යක්ෂමව හා ඵලදායී වන ආකාරයෙන් මෙහෙයවීම සඳහා ආර්ථික වර්ධනය මෙන්ම ආර්ථික සංවර්ධනය ද අත්‍යාවශ්‍ය වනු ඇත. රටක ජනතාවගේ ජීවන තත්ත්වය මෙම කරුණු මත රඳා පවතී. එමෙන්ම රටක ආර්ථික ක්‍රියාවලිය අනෙකුත් අංශයන්ගෙන් වෙන්ව සළකා බැලිය නොහැක. ආර්ථික ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට හැකි වන්නේ ආර්ථිකයට හිතකර ආකාරයෙන් ක්‍රියාවට නැංවිය හැකි තීරණ ගනු ලබන්නේ නම් පමණි. තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ සෑම ක්ෂේත්‍රයක ම නිළධාරීන් නියෝජනය වේ. එබැවින් තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ නිරත වී ඇති බොහෝ දෙනෙක් ආර්ථික න්‍යායන් පිළිබඳ දැනුමක් හා පුහුණුවක් ලබා තිබීම අවශ්‍ය වනු ඇත. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල කිහිපයක් මඟින් මෙලෙස ඇති වන අවශ්‍යතාවන් සපුරාලීමේ අදහසින් විවිධ පාඨමාලා ක්‍රියාත්මක කරනු ලැබුවත් ඒවා ප්‍රමාණවත් නො වන බව පැහැදිලි වී ඇත. මෙම අවශ්‍යතාව තේරුම් ගත් රුහුණ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යනාංශය විසින් රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශයේ අවශ්‍යතාවන් සපුරාලීමට අවශ්‍ය වන ආකාරයෙන්



ආර්ථික විද්‍යාව පිළිබඳ දේශන පදනම් කර ගත් මෙම එක් අවුරුදු ශාස්ත්‍රපති පශ්චාද් උපාධි පාඨමාලාව හඳුන්වා දෙනු ලැබේ. ආර්ථික විද්‍යා අධ්‍යනාංශය යටතේ දැනටමත් පශ්චාද් උපාධි පාඨමාලා ඇති නමුත් ඒවා පර්යේෂණ මත පමණක් පාදක වී ඇති බැවින් දේශන මත පදනම් වන පාඨමාලාවක් ආරම්භ කිරීම කාලෝචිත ක්‍රියාවක් බව පෙන්වා දිය හැකිය.

## 5. ඉලක්ක කණ්ඩායම් (Targeted Groups)

මෙම පාඨමාලාවේ ඉලක්ක කණ්ඩායම් පහත ආකාරයට දැක්විය හැකිය.

(අ) ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය , සැලසුම් ක්‍රියාත්මක කිරීම ආදී ක්ෂේත්‍රයන්හි සේවා නියුක්තිය රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ කළමනාකරුවන් , කළමනාකරණ සහායකයින් සහ සංවර්ධන නිලධාරීන්.

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිළධාරීන්.

(ඇ) උසස් අධ්‍යාපන ආයතන ආර්ථික විද්‍යාව විෂය ඉගැන්වීමේ කාර්යෙහි නිරත ආචාර්යවරුන්.

(ඇ) ආර්ථික විද්‍යාව විෂය ඉගැන්වීමේ කාර්යයෙහි නිරත ගුරු සේවයේ උපාධිධාරීන්.

## 6. පාඨමාලාවේ සැකැස්ම

මෙම පාඨමාලාව දේශන මත පදනම් වූ එක් අවුරුදු පාඨමාලාවකි. එහි දේශන සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. මෙම පාඨමාලාව පූර්ණකාලීන පාඨමාලාවක් සේ සලකනු ලබයි. 2011-2016 රුහුණ විශ්වවිද්‍යාලයේ අතුරු ව්‍යවස්ථාවට අනුව මෙම පාඨමාලාව සඳහා පත් කරනු ලබන සම්බන්ධීකාරක ආයතනයේ (Coordinating Body) නිර්දේශ අනුව උපාධි අපේක්ෂකයන් වශයෙන් ප්‍රථම උපාධියක් හෝ ඊට සමාන වෙනත් සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින් පාඨමාලාව හැදෑරීම සඳහා බඳවා ලනු ලැබේ. වර්ෂයක කාලයක් තුළ විද්‍යාර්ථීන් විසින් පාඨමාලාව නිම කළ යුතු වේ. පාඨමාලා ඒකක ක්‍රමය යටතේ මෙම උපාධි පාඨමාලාවේ දේශන සමාසික දෙකක් තුළ සිදු කරනු ලබන අතර එක් සමාසිකයක් තුළ ප්‍රශ්න පත්‍ර හතර බැගින් වර්ෂය තුළ සම්පූර්ණ කළ යුතු මුළු ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව 8 කි. එක් සමාසිකයක් තුළ එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා පැය 60 ක දේශන පැවැත්වේ. ඒ අනුව සමස්ත පාඨමාලාව සඳහා යොදවන මුළු පැය ගණන 480 ක් වන අතර, අර්ඝ සංඛ්‍යාව 32 කි (4 x 8 = 32 කි).

## 7. පාඨමාලාවේ කාලය

මෙම පාඨමාලාව දේශන මත පදනම් වූ එක් අවුරුදු පාඨමාලාවකි. පාඨමාලාවේ දේශන සුදුසු පරිදි සති අන්තයේ දී සිදු කිරීමට අපේක්ෂිතයි. එසේ වුවද පවතින වසංගත තත්ත්වය සැළකිල්ලට ගනිමින් 2021 වර්ෂයේ දේශන මාර්ගගත (Online) ක්‍රමයට පැවැත්වීමට කටයුතු යොදා ඇත. කෙසේ වුව ද අදාළ වසංගත තත්ත්වය පහව ගිය වහාම දේශන සුපුරුදු පරිදි විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පවත්වනු ඇත. එක් පාඨමාලා ඒකකයක් සඳහා පැය 60 ක දේශන පැවැත්වේ. ඒ අනුව සතියකට පැය 04 බැගින් සති 15 කින් පාඨමාලා ඒකකයක දේශන සම්පූර්ණ කරනු ලැබේ. සමාසිකයක් තුළ එවැනි පාඨමාලා 4ක් සම්පූර්ණ කළ යුතුවේ. මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ අපේක්ෂකයෙකු වර්ෂ තුනක් (3) ඇතුළත පාඨමාලාව සම්පූර්ණ කළ යුතු අතර එසේ නොවන අවස්ථාවන්හි දී අපේක්ෂකයා පාඨමාලාව හැරගිය අයෙකු සේ සළකනු ලබයි. මුල් වර්ෂය තුළ පාඨමාලාව සම්පූර්ණ නොකරන්නේ නම් දිගුවන සෑම වර්ෂයක් සඳහා ම නැවත ලියාපදිංචි ගාස්තු ගෙවීමෙන් වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කළ යුතු ය. එසේ ලියාපදිංචිය දීර්ඝ කළ හැකි උපරිම කාලය වර්ෂ තුනකි.

## 8. අපේක්ෂකත්වය සඳහා වූ සුදුසුකම්

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධිය හෝ රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගත හැකි වෙනත් සුදුසුකම් හෝ සපුරා තිබීම අවශ්‍ය වේ. මෙය 2011 – 2016 ට අනුව යාවත්කාලීන කළ යුතුය.

## 9. අයදුම්පත් කැඳවීම

මෙම පාඨමාලාවට ප්‍රසිද්ධ පුවත් පති දැන්විමක් සහ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි වෙබ් අඩවියේ පළකරන ලද දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ. අධ්‍යනාංශයට අයත් වෙබ් පිටුයෙහි ද පාඨමාලාව පිළිබඳ විස්තර ඇතුළත් කරනු ඇත. පාඨමාලාවට විධිමත් භාවයක් ලබා දීමේ අරමුණින් සෑම වර්ෂයකම ජනවාරි මස මෙම උපාධි පාඨමාලාවේ දේශන ආරම්භ කිරීමට අපේක්ෂා කරන බැවින් ඊට මාස තුනකට පෙර පුවත්පත් දැන්වීම ප්‍රසිද්ධ කිරීම අවශ්‍ය වේ. පාඨමාලාව සඳහා වූ අයදුම්පත් සහකාර ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර යන ලිපිනයෙන් ලබා ගත හැකිය. අයදුම්පත් ලබා ගැනීම සඳහා දැන්වීමේ දක්වා ඇති රුහුණ විශ්වවිද්‍යාලීය මහජන බැංකු ශාඛා ගිණුමට රු. 1000.00 ක මුදලක් බැර කර රිසිට් පතක් ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී සම්පූර්ණ කරන ලද

අයදුම්පත සමඟ පහත සඳහන් සහතිකවල සහතික කරන ලද පිටපත් පාඨමාලා සමායෝජක වෙත ඉදිරිපත් කළ යුතුය. පාඨමාලාවට තෝරා ගැනීමට කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) ප්‍රථම උපාධි සහතිකයේ පිටපතක්

(ආ) උප්පැන්න සහතිකයේ පිටපතක්


(ඇ) පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීමට අදාළ වෙනත් සහතිකවල පිටපතක්

## 10. පාඨමාලා ගාස්තු

මෙම පාඨමාලාව ස්වයං මූල්‍යයන (Self – Financing) ව්‍යාපෘතියක් වන අතර මෙම ව්‍යාපෘතියේ සියළු වියදම් පියවා ගැනීම සඳහා පාඨමාලාවෙන් රැස් කරනු ලබන අරමුදල් යොදා ගැනීමට සිදුවේ. එබැවින් පහත දැක්වෙන ආකාරයට පාඨමාලා ගාස්තු ව්‍යුහය සකස් වේ.

| | |
|---|---|
| අයදුම්පත්‍ර ගාස්තුව | රු. 1000.00 |
| පාඨමාලා ගාස්තුව | රු. 100,800.00 |

(වාරික දෙකකින් ගෙවීමට අවසර ලැබේ.)



**අනෙකුත් ගාස්තුඃ (Other fees)**

| | |
|---|---|
| විභාග ගාස්තුව | රු. 3000.00 |
| පුස්තකාල ගාස්තුව | රු. 2500.00 |
| පුස්තකාල තැන්පතු (නැවත ගෙවන) | රු. 2000.00 |
| ලියාපදිංචි වීමේ ගාස්තුව | රු. 3000.00 |
| ශිෂ්‍ය හැඳුනුම්පත් ගාස්තුව | රු. 300.00 |
| වාර්ෂික ලියාපදිංචි ගාස්තුව (පළමු වසරෙන් පසු) | රු. 1000.00 |
| අසමත්වීම නිසා නැවත පෙනී සිටීමේ ගාස්තුව (එක් ප්‍රශ්න පත්‍රයකට) | රු. 1000.00 |
| සහතික පත් (විස්තරාත්මක) ගාස්තුව | රු. 500.00 |

පාඨමාලාව සඳහා ලියාපදිංචි වන අවස්ථාවේ අදාළ මූලික ගෙවීම් කළ යුතුය. එම ගෙවීම් සිදු කිරීම සඳහා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය මඟින් නිකුත් කරනු ලබන වවුචර් පත භාවිතා කළ යුතු අතර ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ගෙවිය හැකිය.

# 11. විභාග කටයුතු

**(අ) 1. විභාග පටිපාටිය**

11.1 විභාග සැලසුම් කිරීම් සහ පැවැත්වීම ආදී වූ විභාග පරිපාලන කටයුතු පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය මඟින් සිදු කරනු ලබයි.

11.2 සෑම අපේක්ෂකයෙකුම සමාසික අවසාන පරීක්ෂණය සඳහා ලියාපදිංචි වීමට අදාළ අයදුම්පත් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ වෙබ් අඩවියෙන් (www.ruh.ac.lk) භාගත කළ යුතුය.

11.3 එක් සමාසිකයකට ප්‍රශ්නපත්‍ර හතර (4) බැඟින් සමාසික දෙකට ප්‍රශ්න පත්‍ර අටකට පිළිතුරු සැපයිය යුතු වේ.

**(ආ) 2. ඇගයීම් ක්‍රමය**

11.4 ලිඛිත පරීක්ෂණයේ දී එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 60 බැඟින් ලබා ගත යුතු අතර ඉතිරි ලකුණු 40 අඛණ්ඩ ඇගයීම් සඳහා ලබාගත යුතු වේ. සමාසිකයක් තුළ එක් පාඨමාලා ඒකකයක් සඳහා පැවරුම් දෙකකට සහ මධ්‍ය සමාසික පරීක්ෂණයට අපේක්ෂකයින් මුහුණ දිය යුතු වේ. එක් පැවරුමක් සඳහා ලකුණු 10 බැඟින් පරීක්ෂණයට ලකුණු 20 ක් ද, මධ්‍ය සමාසික පරීක්ෂණයට ලකුණු 20 ක් ද වශයෙන් අඛණ්ඩ ඇගයීම් සඳහා මුළු ලකුණු 40ක් ලබා දෙනු ඇත. අඛණ්ඩ ඇගයීම්වල ස්වභාවය පහත සඳහන් පරිදි වේ.

පන්ති කාමර පරීක්ෂණ (Class Room Tests)

ක්ෂණික ප්‍රහේලිකා (Quizzes)


කණ්ඩායම් පැවැරුම් (Group Projects)

ශ්‍රව්‍ය දෘෂ්‍ය ඉදිරපත් කිරීම් (Audio – Visual Presentations)

මධ්‍ය සමාසික පරීක්ෂණ (Mid Term Tests)

11.5 විභාග කටයුතුවල ගුණාත්මකභාවය සහ සංගත බව ආරක්ෂාකර ගැනීම සඳහා පිළිතුරු පත්‍ර පළමුවර පරීක්ෂාව සහ දෙවනවර පරීක්ෂාව වශයෙන් පරීක්ෂකවරුන් දෙදෙනෙකු යටතේ සිදු කරනු ලබයි.

11.6 එක් එක් පාඨමාලා ඒකකයට ලබාගත් ලකුණු ප්‍රමාණය මත අදාළ ශ්‍රේණි ලක්ෂ්‍ය (Grand Point) තීරණය කරනු ලබයි. පාඨමාලාව අවසානයේ දී සියළු පා්ඨමාලා ඒකකවල ශ්‍රේණි ලක්ෂ්‍යයන්හි සාමාන්‍ය (Grade Point Average – GPA) ගණනය කෙරේ. ශ්‍රේණි ලක්ෂ්‍යයන්හි සාමාන්‍ය ගණනය කිරීමේදී එක් එක් පාඨමාලාවේ අර්ස සංඛ්‍යාව ඒ ඒ පාඨමාලාව සඳහා ලබාගත් ශ්‍රේණි ලක්ෂ්‍යයෙන් බර තබා අංක ගණිතමය මධ්‍යන්‍යය ගණනය කරනු ලබයි. පාඨමාලාවේ අවසාන සාධන මට්ටම තීරණය කරනු ලබන්නේ මෙම ශ්‍රේණි ලක්ෂ්‍යය සාමාන්‍ය මත ය. ශ්‍රේණි ලක්ෂ්‍යය සාමාන්‍ය ගණනය කරනු ලබන ආකාරය පහත පරිදි වේ.



$$GPA = \frac{Ci\ Gi}{Ci}$$

Ci = I වැනි පාඨමාලා ඒකකය සඳහා වූ අර්ඝ සංඛ්‍යාව

Gi = I වැනි පාඨමාලා ඒකකය සඳහා ලබා ගන්නා ලද ශ්‍රේණි ලක්ෂ්‍ය වටිනාකම

පාඨමාලා ඒකකයක් සමත්වීමට අවශ්‍ය අවම ශ්‍රේණි ලක්ෂ්‍ය 2.30 ක් වේ. ඊට අඩු ශ්‍රේණි ලක්ෂ්‍යයන් ලබාගන්නා අපේක්ෂකයින් එම පාඨමාලා ඒකකයට ඊළඟ අවස්ථාවේ දී පෙනී සිට සාමාර්ථය ලබාගත යුතුය. කිසියම් පාඨමාලා ඒකකයක් සඳහා නැවත පෙනී සිටින අවස්ථාවක දී අපේක්ෂකයා කෙතරම් ඉහළ ලකුණු ලැබුවත් ලැබෙන ශ්‍රේණිය C+ පමණක් වනු ඇත.

### 11.7 ප්‍රශ්න පත්‍ර ඇගයීමේදී දෙනු ලබන ලකුණු ප්‍රමාණයන්, ශ්‍රේණි සහ ශ්‍රේණි ලක්ෂ්‍යයන් පහත පරිදි වේ

| ලකුණු | ශ්‍රේණිය | ශ්‍රේණි ලක්ෂ්‍ය වටිනාකම |
|---|---|---|
| 85 - 100 | A+ | 4.00 |
| 75 - 84 | A | 4.00 |
| 70 - 74 | A- | 3.70 |
| 65 - 69 | B+ | 3.30 |
| 60 - 64 | B | 3.00 |
| 55 - 59 | B- | 2.70 |
| 50 - 54 | C+ | 2.30 |
| 45 - 49 | C | 2.00 |
| 40 - 44 | C- | 1.70 |
| 35 - 39 | D+ | 1.30 |
| 25 - 34 | D | 1.00 |
| 24 ට අඩු | E | 0.00 |

11.8 සමස්ත සාධන මට්ටම පහත පරිදි නිර්ණය කරනු ලබයි.

**i. සාමාන්‍ය සාමර්ථය**

(a) තෙවතාවකට නොවැඩි වාර ගණනක දී සියලුම පාඨමාලා ඒකක සම්පූර්ණ කර තිබිය යුතුය.

(b) සමස්ත ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍යය අවම වශයෙන් 2.30 ක් හෝ ඊට වඩා වැඩි විය යුතුය.

(c) සෑම පාඨමාලා ඒකකයක් සඳහා ම අවම ශ්‍රේණි ලක්ෂ්‍යය 2.30 හෝ ඊට වඩා වැඩි ශ්‍රේණි ලක්ෂ්‍යයක් ලබා තිබිය යුතුය.

**ii. කුසලතා සාමාර්ථය**

1. පළමු වතාවේ දී සියළු පාඨමාලා ඒකක සම්පූර්ණ කර තිබිය යුතු ය.
2. සමස්ත ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍ය අවම වශයෙන් 3.70 ක් හෝ ඊට වැඩි විය යුතුය.
3. පාඨමාලා ඒකක සංඛ්‍යාවෙන් අඩකට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට 3.70 හෝ ඊට වඩා වැඩි ශ්‍රේණි ලක්ෂ්‍යයක් ලබා තිබිය යුතුය.

11.9 අපේක්ෂකයෙකුට විෂය ඒකකයකට හෝ කිහිපයකට පෙනී සිටීමට නොහැකි වූයේ නම් ඔහුට පිළිගත් වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ හැකිය. එවිට එම වෛද්‍ය සහතිකය

සඳහා ලැබෙන විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරී නිර්දේශය විශ්වවිද්‍යාල සනාතන සභාව අනුමත කරන්නේ නම් පමණක් අපේක්ෂකයා අදාළ පරීක්ෂණය සඳහා පළමු වරට පෙනී සිටින අවස්ථාවක් සේ සළකනු ලබයි. එසේ නොවන අවස්ථාවක පාඨමාලා ඒකකයකට හෝ කිහිපයකට පෙනී සිට අසමත් වූවා සේ සලකනු ලැබේ.

11.10 විභාග ප්‍රතිඵල රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතියට යටත් විය යුතුය.

## 12. පාඨමාලා පරිපාලනය හා දේශන පැවැත්වීම

12.1 මෙම ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අධ්‍යයන හා පරිපාලන කටයුතු මෙහෙයවීම මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපතිගේ උපදෙස් මත අධ්‍යයන සමායෝජක විසින් සිදු කරනු ලබයි.

12.2 මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීමේ පුවත්පත් දැන්වීමනියමිත කාලයේ ප්‍රසිද්ධ කිරීම, පාඨමාලා සමායෝජකයන්ගේ මඟ පෙන්වීම යටතේ ලිඛිත පරීක්ෂණ පැවැත්වීම ආදී වූ කාර්යයන් මානව ශාස්ත්‍ර හා

සාමාජීය විද්‍යා පීඨයේ සහකාර ලේඛකාධිකාරී විසින් ඉටු කළ යුතු ය.

12.3 පාඨමාලාවේ ලිපිගොනු පවත්වාගෙන යාම සහ සාමාන්‍ය කාර්යාලය කටුයුතු සාමායෝජකවරයාගේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාම සඳහා ආර්ථික විද්‍යා අධ්‍යනාංශයේ ලිපිකරුවෙකු සහ පරිගනක දත්ත හැසිරවීමේ ශිල්පියෙකුගේ සේවාව අවශ්‍ය වේ.

12.4 පාඨමාලාවේ පරිපාල කටයුතු සඳහා සමායෝජකවරයෙකු පත් කිරීම සඳහා ආර්ථික විද්‍යා අංශයේ අංශ ප්‍රධාන විසින් පීඨාධිපති හරහා උපකුලපතිතුමා වෙත නිරිදේශයක් ඉදිරිපත් කරනු ඇත.

12.5 පාඨමාලාවේ මූල්‍ය කටුයුතු මෙහෙයවීම සහකාර මූල්‍යාධිකාරීන්ගෙන් අපේක්ෂා කරයි.

## 13. පාඨමාලාව සඳහා නියමිත අවම අපේක්ෂකයින් සංඛ්‍යාව

පාඨමාලාව සාර්ථකව පවත්වා ගෙන යාම සඳහා අවම වශයෙන් අපේක්ෂකයින් 20ක ප්‍රමාණයක් සිටිය යුතුය. එසේ නොවන අවස්ථාවන්හි දී අපේක්ෂකයින්ට පාඨමාලා ගාස්තු පමණක් ආපසු ගෙවනු ලැබේ.

## 14. උපාධි වලංගු වන කාලය

සාර්ථක ලෙස පාඨමාලාව හදාරා දෙවන සමාසිකයේ අවසාන පරීක්ෂණයේ අවසාන පත්‍රිකාවට පෙනී සිටි දිනය උපාධි වලංගු වන දිනය වේ.

## 15. සහතික පත් සහ ලකුණු පිටපත්

මෙම ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා පිරිනමනු ලබන සහතික පත්‍රය රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨය විසින් සනාතන සභා අනුමැතිය ලබා ඇති සහතිකය පත්‍ර ආකෘතියට අනුකූල විය යුතුය. සහතික පත් සහ ලකුණු පිටපත් නිකුත් කිරීම , විභාග වාර්තා පවත්වාගෙන යාම රුහුණ විශ්වවිද්‍යාලයේ අනුමත නීති රීති වලට අනුකූල වේ.

## 16. සම්බන්ධීකාරක ආයතනය (Coordinating Body)

අධ්‍යනාංශ ප්‍රධාන (සාමාජික)

අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් (සාමාජික)

පාඨමාලාවේ සමායෝජක (සභාපති)

අංශ ප්‍රධන විසින් තෝරා පත්කරනු ලබන අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් දෙදෙනෙක් (සාමාජික)

සහකාර ලේඛකාධිකාරී, මානව ශාස්ත්‍ර හා සමාජීයීය විද්‍යා පීඨය (ලේකම්)



## 17. පාඨමාලාව සඳහා නියමිත විෂයයන්

මෙමම පාඨමාලාව සඳහා පහත දැක්වෙන ආකාරයෙන් විෂයයන් 08ක් ඇතුළත් වන අතර එක් විෂය ඒකකයක් සඳහා සතියකට පැය 04 බැගින් සති 15 ක දේශන පැවැත්වේ. පාඨමාලාවේ සම්පූර්ණ කාලය පැය 480 ක් හෙවත් අර්ස 32 කි. අපේක්ෂකයින් විසින් පහත දක්වා ඇති සියළු විෂයයන් සමත් විය යුතුය. මෙම පාඨමාලාව පහත දැක්වෙන ආකාරයට විෂය අටකින් සමන්විත වේ.

**පළමු සමාසිකය**

MAE 5100 - සූක්ෂම ආර්ථික න්‍යාය

MAE 5101 - සාර්ව ආර්ථික න්‍යාය

MAE 5102 - ආර්ථික සංඛ්‍යාතය

MAE 5103 - ශ්‍රී ලංකා ආර්ථිකය

**දෙවන සමාසිකය**

MAE 5200 - ව්‍යාපෘති කළමනාකරණය


MAE 5201 - රාජ්‍ය කටයුතු පිළිබඳ ආර්ථික විද්‍යාව

MAE 5202 - මූල්‍ය ආර්ථික විද්‍යාව

MAE 5203 - ලෝක ආර්ථික ප්‍රවණතා

## 18. උපාධි ප්‍රධානය කිරීම

නියමිත කොන්දේසි සපුරා ඇති අපේක්ෂකයින් සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ නිර්දේශය මත පාලක



සභාවේ අනුමැතියට යටත්ව රුහුණු විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන උපාධි ප්‍රධානොත්සවයක දී ශාස්ත්‍රපති උපාධිය පිරිනමනු ලැබේ.

## 19. සම්පත් දායකත්වය / ඉගැන්වීමේ කාර්ය මණ්ඩලය

- Dr A.J.M Chandradasa - PhD (Rajasthan), MPhil (Ruhuna), BA (Peradeniya)
- Mr S.K Derwin - MPhil, BA (Ruhuna)
- Dr B.M Sumanarathna - PhD (Sheffield), MPhil (Ruhuna), BA (Peradeniya)
- Dr K.H Nandasiri - PhD (Colombo), M. Soc.Sci (NUS-Singapore),
  BA (Peradeniya)
- Mr K.K.S Udayakantha - MPhil (Ruhuna), BA (J'Pura)
- Mr L.K.K Peiris - MPhil (Ruhuna), BA (Colombo) Dr Chandika Gunasinaghe (Coordinator) - PhD (Griffith, Australia), MSc (Agder), BA (Colombo)
- Dr K.A Nisantha - PhD, MSc (Colombo), PGDip-Stat (J'Pura), BA (J'Pura)
- Mr W.A.N.D Wijesinghe - MSc in CA (Bangalore), BSc (Ruhuna)
- Mr H.K Sarath - MPhil (Peradeniya), BA (Ruhuna)



## 20. ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයීය බල මණ්ඩලය

ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සම්බන්ධ සියලු අධ්‍යයන හා පරිපාලන කටයුතු විශ්වවිද්‍යාල පනතේ විධි විධානවලට යටත්ව හා මෙම පාඨමාලාවේ අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පවත්වාගෙන යනු ලබන අතර ඒ සම්බන්ධව කටයුතු කිරීමේ සියලු බලතල පහත සඳහන් බල මණ්ඩල වෙත පැවරී ඇත.

පාලක සභාව (Council)

සනාතන සභාව (Senate)

අධ්‍යාපන මණ්ඩලය / පශ්චාද් උපාධි පීඨය (Study Board / Graduate Studies)

අධ්‍යයන මණ්ඩල (මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය) (Study Board / Faculty of Humanities & Social Sciences)

සම්බන්ධීකාරක ආයතනය (Coordinating Body)



## ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව විස්තරාත්මක විෂය නිර්දේශය

- **පළමු සමාසිකය**

1. MAE 5100 - සූක්ෂම ආර්ථික න්‍යාය (Micro Economic Theory)
2. MAE 5101 - සාර්ව ආර්ථික න්‍යාය (Macro Economic Theory)
3. MAE 5102 - ආර්ථික සංඛ්‍යාතය (Economic Statistics)
4. MAE 5103 - ශ්‍රී ලංකා ආර්ථිකය (Sri Lankan Economy)

- **දෙවන සමාසිකය**

1. MAE 5200 - ව්‍යාපෘති කළමනාකරණය (Project Management)
2. MAE 5201 - රාජ්‍ය කටයුතු පිළිබඳ ආර්ථික විද්‍යාව (Public Sector Economics)
3. MAE 5202 - මූල්‍ය ආර්ථික විද්‍යාව (Financial Economics)
4. 5203 - ලෝක ආර්ථික ප්‍රවණතා (World Economic Trend)



**පාඨමාලා ඒකකය :** සූක්ෂම ආර්ථික න්‍යාය (Micro Economic Theory)

**කේතය :** MAE 5100

**අර්ඝ ප්‍රමාණය :** 04

**කාලය :** පැය 60




## අභිමතාර්ථ

1. සූක්ෂම ආර්ථික න්‍යාය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීම.
2. සූක්ෂම ආර්ථික විද්‍යාවේ ප්‍රයෝගික යෙදීම් අවබෝධ කර ගැනීම.
3. වෙළෙඳපොළ ඉල්ලුම තක්සේරු කිරිමට හා සීමාවන්ට යටත්ව සැපයුම් කළමනාකරණය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා ගැනීම.
4. සූක්ෂම ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.

## පාඨමාලා අන්තර්ගතය

**1. පාරිභෝගික හැසිරීම පිළිබඳ න්‍යායාත්මක ප්‍රවේශයන්:**

සංරෝධක හමුවේ උපයෝගීතාව උපරිම කිරීම, මාර්ෂලියානු ඉල්ලුම් ශ්‍රිතයේ මූලික ලක්ෂණ, වක්‍ර

උපයෝගිතා ශ්‍රිතය, වියදම් ශ්‍රිතය..... හික්සියානු ඉල්ලුම් ශ්‍රිතය...... වියදම් ශ්‍රිතය...... හා ඍජු උපයෝගිතා ශ්‍රිතය අතර සම්බන්ධය...... පාර්භෝජන සුඛසාධනය පිළිබඳ මිණුම්...... වන්දි විචලනය හා සමබර විචලනය......, ඉල්ලුම් ශ්‍රිත ප්‍රායෝගිකව ඇස්තමේන්තු කිරීම......, අවදානම් හමුවේ තේරීම් කිරීම.

**2. ආයතනය පිළිබඳ න්‍යාය :**

නිෂ්පාදන ශ්‍රිත, ප්‍රශස්ත යෙදවුම් සංයුතිය, ආදේශන නම්‍යතාව පිරිවැය ශ්‍රිත, ස්ථාවර හා විචල්‍ය පිරිවැය, ගිලුණු පිරිවැය..... කෙටිකාලීන හා දිගුකාලීන පිරිවැය.......

**3. වෙළඳපොළ විග්‍රහයන් :**

තරඟකාරී වෙළෙඳපොළක කෙටිකාලීන හා දිගුකාලීන හැසිරීම, පැරේටෝ කාර්යක්ෂමතාව.

බදු පැනවීමේ.. සුභසාධන ප්‍රතිවිපාක.. පූර්ණ කරඟකාරී වෙළෙඳපොළ විග්‍රහය

ඒකාධිකාරී වෙළෙඳපොළ විග්‍රහයන්... මිළ විභේෂණ... ඒකාධිකාරයේ හා පූර්ණ තරගයේ සුභසාධන ප්‍රතිවිපාක සැසඳීම..

ඒකාධිකාරී තරඟය.... කතිපයාධිකාරය

**4. ක්‍රීඩා න්‍යාය:**

ශූන්‍ය එකතු ක්‍රීඩා හා ශූන්‍ය නොවන එකතුව සහිත ක්‍රීඩා, නැෂ් සමතුලිතය

**5. පොදු සමතුලිතතාවය හා සුභසාධන ආර්ථික විද්‍යාව...., කාර්යක්ෂමතාව හා සාධාරණත්වය අතර ගැටුම....**

**6. වෙළෙඳපොළ අසමත්වීම:**

නියාමනය හා රෙගුලාසීහරණය... පොදු තේරීම් පිළිබඳ න්‍යාය

## නිර්දේශිත කියවීම් :


1. Koutsoyiannis. (1979), Modern Micro Economics. Macmillan Hongkong.
2. Nicholoson. W. (1985), Micro Economic Theory: Basic Principle and Extensions, Drider Press, New York.
3. Varian. H. (1992), Micro Economic Analysis, W.W Norton. New York.


## ඇගයීමේ ක්‍රමය:

| | |
|---|---|
| අඛණ්ඩ ඇගයුම් සඳහා | 40% |
| (අ) පන්ති කාමර පරීක්ෂණ | |
| ක්ෂණික ප්‍රහේලිකා | |
| කණ්ඩායම් පැවැරුම් | |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය ඉදිරිපත් කිරීම් | 20% |
| (ආ) මධ්‍ය සමාසික පරීක්ෂණය | 20% |
| අවසාන සමාසික පරීක්ෂණය | 60% |
| එකතුව | 100% |

**පාඨමාලා ඒකකය** : සාර්ව ආර්ථික න්‍යාය (Macro Economic Theory)

**කේතය** : MAE 5101

**අර්ස ප්‍රමාණය** : 04

**කාලය** : පැය 60




## අභිමතාර්ථ

1. සාර්ව හා සූක්ෂම ආර්ථික විද්‍යාව අතර වෙනස හඳුනා ගැනීම.
2. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති හා අරමුණු හඳුනා ගැනීම.
3. විවිධ ආර්ථික ගුරුකුල යටතේ සාර්ව ආර්ථික සමස්තයන් තීරණය වන ආකාරය විග්‍රහ කර ඇත්තේ කෙසේ ද යන්න අවබෝධ කර ගැනීම.
4. සාර්ව ආර්ථික ප්‍රශ්න න්‍යායාත්මකව විග්‍රහ කිරීම.
5. සාර්ව ආර්තික ප්‍රශ්න හඳුනා ගැනීම හා විසඳීම සඳහා න්‍යාය හා ප්‍රතිපත්ති භාවිතා කළ හැකි ආකාරය අවබෝධ කර ගැනීම.

## පාඨමාලා අන්තර්ගතය

1. සාර්ව ආර්ථික න්‍යාය : හැඳින්වීම
2. ව්‍යාපාර චක්‍ර : ආර්ථික උච්ඡාවචන හා උපනති
3. සේවා නියුක්තිය හා ආදායම පිළිබඳ සම්භාව්‍ය න්‍යාය

4. සමස්ත ඉල්ලුම් වක්‍ර සැපයුම් වක්‍ර ව්‍යුත්පන්න කිරීම
5. සේවා නියුක්තිය හා ආදායම පිළිබඳ කේන්සියානු න්‍යාය
6. IS – LM ආකෘතිය: සාර්ව ආර්ථික ප්‍රතිපත්තිමය විවාද
7. සමස්ත ඉල්ලුම හා සැබයුම පිළිබඳ විවිධ අදහස්
8. මුදල් හා ආර්ථිකය : මුදල් ඉල්ලුම පිළිබඳ විවිධ අදහස්
9. මුදල් සැපයුම, මූල්‍ය සමාහාර, අධිබල හා මුදල් ගුණකය
10. උද්ධමනය හා සේවා නියුක්තිය සම්බන්ධතාව, උද්ධමනය පිළිබඳ විවිධ අදහස්
11. ආරම්භක පිලිප්ස් වක්‍රය, තාර්කික අපේක්ෂණය හා සම්බන්ධ පිලිප්ස් වක්‍රය
12. නිරුද්ධමනයේ මූර්ත පිරිවැය, වේදනා රහිත නිරුද්ධමනය
13. නව සාර්ව ආර්ථික විද්‍යාව, තාර්කික අපේක්ෂණ විප්ලවය, මූර්ත ව්‍යාපාර වක්‍ර න්‍යාය, නව කේනිසියානු ස්ථාවර වැටුප් ආකෘතිය
14. සැපයුම් අංශයේ ආර්ථික විද්‍යාව, ප්‍රායෝගික සාක්ෂි
15. ජාත්‍යන්තර වෙළෙඳාම, ගෙවුම් ශේෂය හා විනිමය අනුපාතිකය
16. විවෘත ආර්ථික සාර්ව ආර්ථික විද්‍යාව, මන්ඩේල් ප්ලේමින් ආකෘතිය

17. ආර්ථික වෘර්ධිය පිළිබඳ න්‍යායන්, කේන්සියානු, හැරල්ඩ් ඩෝමාර්, නව සම්භාව්‍ය

**නිර්දේශිත කියවීම් :**


1. Farmer, Rogrer, E.A., (2002), Macroeconomics, 2nd ed, Southern, Thomson Learning.
2. Mankew, G.N., (2000), Macroeconomis, 4th ed, New York.
3. Tailor. J.B., (1995), Priciples of Macroeconomics, Honghlon, Mittin Company, Boston, Toronto.
4. Dornbush. R., Fisher. S., Strartz. K., (2001), Macroeconomics, 8th ed., New York., Mc Grow-Hill.
5. Campbell. R., McConnell Stanley. L., Brue., (1996).
6. Samuelson. P.A., Nordhaus. W.D., (2000), Economics 17th ed, New York., Mc Grow-Hill.


**ඇගයීමේ ක්‍රමය:**

අඛණ්ඩ ඇගයුම් සඳහා 40%

(අ) පන්ති කාමර පරීක්ෂණ

ක්ෂණික ප්‍රහේලිකා

| | |
|---|---|
| කණ්ඩායම් පැවැරුම් | |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය ඉදිරිපත් කිරීම් | 20% |
| (ආ) මධ්‍ය සමාසික පරීක්ෂණය | 20% |
| අවසාන සමාසික පරීක්ෂණය | 60% |
| එකතුව | 100% |

**පාඨමාලා ඒකකය** : ආර්ථික සංඛ්‍යානය (Economic Statistics)



**කේතය** : MAE 5102

**අර්ස ප්‍රමාණය** : 04

**කාලය** : පැය 60

## අභිමතාර්ථ

1. දත්ත විශ්ලේෂණයට අවශ්‍ය මූලික වැදගත් සංඛ්‍යාන ක්‍රම කිහිපයක් පිළිබඳ දැනුමක් ලබා දීම.
2. එම දැනුම තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී උපයෝගී කර ගන්නා ආකාරය පිළිබඳ ව අවබෝධයක් ලබා දීම.
3. පරිගණක භාවිතයෙන් දත්ත විශ්ලේෂණය, අර්තකථනය සඳහා පෙරහුරුවක් ලබා දීම.

## පාඨමාලා අන්තර්ගතය

1. හැඳින්වීම හා දත්ත හැසිරවීම: විස්තරාත්මක සහ අනුමිතික සංඛ්‍යානය, දත්ත, විචල්‍ය ආදී මූලික සංඛ්‍යාන සංකල්ප.
2. කේන්ද්‍රික ප්‍රවණතාව සහ අපකිරණ මිනුම්: මධ්‍යනාය, මධ්‍යස්ථ, සාතය, සම්මත අපගමන, විචල්‍යතාව, කුටිකතාව හා වක්‍රීමය.

3. සම්භාවිතා න්‍යාය: හැඳින්වීම, ප්‍රත්‍යක්ෂයන්, මූලික සම්භාවිතාව ප්‍රමේයයන්, ස්වයත්තතාව, මුළු සම්භාවිතාව, බේයස් ප්‍රමේයය, සසම්භාවි විචල්‍යයන්, සම්භාවිතාව ශ්‍රිත හා ව්‍යාප්තීන්, න්‍යායාත්මක සම්භාවිතා ව්‍යාප්තීන්, බද්ධ සම්භාවිතාව.
4. සංඛ්‍යාන අනුමිතිය: නියැදුම් ව්‍යාප්තීන්, නිමානය සංගණන පරාමිතීන් සඳහා විශ්‍රම්භ ප්‍රාන්තර, කල්පිත පරීක්ෂා.
5. අපරාමිතික සංඛ්‍යාන ක්‍රම: කයි වර්ග පරීක්ෂා, කොල්මොගොරොව් - ස්මිර් - කෝව් පරීක්ෂාව, පෙළ පරීක්ෂාව, මැක්විට්නි පරීක්ෂාව, කාල්කාෂ් වොලිස් සහ ප්‍රිඩ්මාන් පරීක්ෂාව.
6. ප්‍රතිපායන ආකෘති: සහ-සම්බන්ධතා විශ්ලේෂණය, සරළ රේඛිය ප්‍රතිපායනය, බහුගුණ ප්‍රතිපායනය, ප්‍රතිපායනයේ ශ්‍රිතාත්මක ස්වරූපය.
7. කාලශ්‍රේණි ආකෘතිකාරණයේ මූලිකාංග: හැඳින්වීම, සුමටන ක්‍රම, කාල ශ්‍රේණියක් වියෝජනය කිරීම, සම්භාවිතා ආකෘති පුරෝකථනය.
8. රේඛීය ප්‍රකමණ: ප්‍රස්තාරික ක්‍රමය, සරලා ක්‍රමය හා M ක්‍රමය.

**නිර්දේශිත කියවීම් :**


1. David. M. Leninec., Krehbell and Mark. L., Berenson., (2001), Business Statistcis., A Frist Course., 2nd sedition., Addison Wesley Longman, Singapore.
2. Johanson. R. & Kuby. P.G., (2004), Elementary Statistics, 9th edition., Thomson Learning., USA.
3. Feller & Williom., (1993), An Introduction to Probability Theory and Its Applications., Vol. 1., Wiley Eastern, New Dilhi, Boston.
4. Urry & Syd., (1992), An Introduction to Operational Research, The beat of everything Orient Longman., Hyderabad.
5. Jayatiss. W.A., (1996), "Mulika Sankyana Vidyawa – III., Tharangi Printers., Maharagama.
6. Miller. Robert. B., (1997) Intermediate business statistics analysis of vacances, regression and time series, Holt, Rinehart and Winston., New York.
7. Vithanage, P. (200) Sankanaya: Probability and probability distribution, Wijesuriya Grautha Kendraya Colombo.

## ඇගයීමේ ක්‍රමය:

| | | |
|---|---|---|
| අඛණ්ඩ ඇගයුම් සඳහා | | 40% |
| (අ) | පන්ති කාමර පරීක්ෂණ | |
| | ක්ෂණික ප්‍රහේලිකා | |
| | කණ්ඩායම් පැවැරුම් | |
| | ශ්‍රව්‍ය දෘෂ්‍ය ඉදිරිපත් කිරීම් | 20% |
| (ආ) | මධ්‍ය සමාසික පරීක්ෂණය | 20% |
| | අවසාන සමාසික පරීක්ෂණය | 60% |
| | එකතුව | 100% |

**පාඨමාලා ඒකකය** : ශ්‍රී ලංකාවේ ආර්ථිකය (Sri Lankan Economy)

**කේතය** : MAE 5103

**අර්ඝ ප්‍රමාණය** : 04

**කාලය** : පැය 60



## අභිමතාර්ථ

1. ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික තත්ත්වය විග්‍රහ කිරීම.
2. වර්තමාන ආර්ථික ගැටළු හා ඒවායේ බලපෑම විග්‍රළුහ කිරීම.
3. පවත්නා ආර්ථික ප්‍රශ්න පිළිබඳව පුළුල් දැනුමක් ලබාදීම හා ඒවා ජන ජීවිතයට කරනු ලබන බලපෑම පිළිබඳව අවබෝධයක් ලබාදීම.

## පාඨමාලා අන්තර්ගතය

1. හැඳින්වීම : නිදහස ලබා ගත් දින සිට සමස්ත ආර්ථික ප්‍රවනථාවන්.
2. පවත්නා ආර්ථික ප්‍රශ්න හා අභියෝගයන් හඳුනා ගැනීම.
3. කෘෂි කාර්මික සංවර්ධනය : ප්‍රවනතාවන් හා අනාගත අභියෝග.
4. කර්මාන්ත සංවර්ධනය : වෘද්ධි ප්‍රවනතා හා ගැටළු.

5. සාර්ව ආර්ථික අසමතුලිතතාව හා අයවැය ක්‍රියාකාරීත්වය.
6. ආර්ථිකය තුළ රාජ්‍ය අංශයේ කාර්යභාර්ය.
7. ජනගහන ප්‍රවනතාවන් හා ආර්ථික බලපෑම.
8. යහ පාලනය.
9. අධ්‍යාපන හා සංවර්ධනය.
10. ශ්‍රම වෙළඳපොළ.
11. ආදායම් ව්‍යාප්තිය හා දරිද්‍රතාව.
12. පෞද්ගලිකරණයේ ගැටළු හා අභියෝග.

**නිර්දේශිත කියවීම් :**


1. Central Bank of Sri Lanka (Various Reports.) Central Bank of Sri Lanka – Annual Reports.
2. Lakshman. W.D., (edi), (1997), Dilemmas of Developemnt., Sri Lanka Association of Economists., Colombo.
3. Lakshman. W.D. and Tisdell. A, (2000), Sri Lanka Development Since Independence: Socio Economic Perspective and Analysis, Nova Science Publisher, Ine., New York.
4. Snodgrass, D.R., (1996), Ceylon: An Export Economy and Translation, Illinois, The Economic Growth Center, Yale University.

5. Senanayaka. S.U.P., W. Wimalarathna and Amala De Silva, (2008), Development Prospectives, Development of Economics., Colombo.
6. Kelegama. S., (2004)., Economi Policy in Sri Lamka: Issues and Debates, London Sage Publications Ltd.
7. සඳරත්න නිමල්, (2004), ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය, කැන්ඩි බුක්ස්, මහනුවර.

**ඇගයීමේ ක්‍රමය:**

| | |
|---|---|
| අඛණ්ඩ ඇගයුම් සඳහා | 40% |
| (අ) පන්ති කාමර පරීක්ෂණ | |
| ක්ෂණික ප්‍රහේලිකා | |
| කණ්ඩායම් පැවැරුම් | |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය ඉදිරිපත් කිරීම් | 20% |
| (ආ) මධ්‍ය සමාසික පරීක්ෂණය | 20% |
| අවසාන සමාසික පරීක්ෂණය | 60% |
| එකතුව | 100% |

**පාඨමාලා ඒකකය** : ව්‍යාපෘති කළමණාකරණය

(Project Management)

**කේතය** : MAE 5200

**අර්ඝ ප්‍රමාණය** : 04

**කාලය** : පැය 60




## අභිමතාර්ථ

1. ව්‍යාපෘති පරිසර හා සම්බන්ධ සංකල්ප හා ව්‍යාපෘති ඇගයීම් ක්‍රම ශිල්ප පිළිබඳ අවබෝධයක් ලබාදීම.
2. ව්‍යාපෘති කළමණාකරණ සංකල්ප හා ව්‍යාපෘති කළමණාකරණයේ දී යොදා ගන්නා උපකරණ කට්ටලය භාවිතය පිළිබඳ දැනුම ලබා දීම.
3. පරිගණක මෘදුකාංග භාවිතයෙන් ව්‍යාපෘතියක කාර්ය සාධනය උපරිමනය කිරීම හා ව්‍යාපෘති කළමණාකරුවකුගේ කාර්යක්ෂමතාව ඉහළ නංවා ගත හැකි ආකාරය අවබෝධ කර ගැනීම

## පාඨමාලා අන්තර්ගතය

1. ව්‍යාපෘති හඳුන්වා දීම : ව්‍යාපෘති පිළිබඳ නිර්වචන, ව්‍යාපෘති වර්ග, ව්‍යාපෘතියක ජීවන චක්‍රය, ව්‍යාපෘති කළමණාකරණ සංකල්ප.

2. පෞද්ගලික ව්‍යාපෘති ඇගයීම:

වෙළෙඳපොළ විශ්ලේෂණ : තාක්ෂණික විශ්ලේෂණය මූල්‍ය විශ්ලේෂණය ගිණුම්කරණ පිරිවැය හා ආවස්ථික පිරිවැය, ශුද්ධ වර්තමාන වටිනාකම, අභ්‍යන්තර ඉපැයුම් අනුපාතය, පිළිගෙවීම් කාලය, අරමුදල් ප්‍රවාහන ලේඛණ, සංවේදීතා විශ්ලේෂණය.

3. රජයේ ව්‍යාපෘති ඇගයීම : පිරිවැය වාසි විශ්ලේෂණය, සමාජ වට්ටම් අනුපාතය, සෙවනැලි මිල, වෙනස් කාල පරාස සඳහා වට්ටම් කිරීම, තේරීම් මිල, අර්ධ තේරීම් වටිනාකම, පාරිසරික බලපෑම් විශ්ලේෂණය.

4. ව්‍යාපෘති කළමණාකරණය

ව්‍යාපෘති සැලසුම්කරණය, ජාල විශ්ලේෂණය, වැඩ අනුබෙදුම් සටහන, වගකීම් න්‍යාය, බීටා ව්‍යාප්තිය ඇසුරින් ව්‍යාපෘති කාල නිර්ණය, සම්පත් සංරෝධක යටතේ සැලසුම් කිරීම, ක්‍රියාකාරකම් මත පදනම් වූ ඇස්තමේන්තුව.

ව්‍යාපෘති පාලනය : අවධි - දම්වැල් ප්‍රවේශය, සම්පත් සුමට කිරීම, ව්‍යාපෘති අවදානම් කළමණාකරණය: අවදානම් හඳුනා ගැනීම, අවදානම තක්සේරු කිරීම, අවදානම් අවම කිරීම.

මානව සම්පත් කළමණාකරණය : ව්‍යාපෘති කළමණාකරුවාගේ කාර්යභාර්යය, කණ්ඩායම් ගොඩනැගීමේ උපායමාර්ග, ගැටුම් නිරාකරණය.

සංවිධාන ව්‍යුහය, ක්‍රියාකාරීත්වය පදනම් වූ සංවිධාන, ව්‍යාපෘති ආකාර සංවිධාන, න්‍යාාස ආකාර සංවිධාන.

5. ව්‍යාපෘති සාර්ථකත්වය, ඇගයීම හා වාර්තාකරණය.
6. ව්‍යාපෘති කළමණාකරණය මෘදුකාංග භාවිතය, මයික්‍රොසොෆ්ට් ප්‍රොජෙක්ට් - 2003.

   අන්තර්ජාලය හරහා ජාත්‍යන්තර ව්‍යාපෘති කළමණාකරණ ආයතනවලට සංචාරයක්....

## නිර්දේශිත කියවීම් :


1. Beardmon. A.E., Greenberg. D. Vining. A.R., Weimer. D.L., (1996), Cost Benefit Analysise Concepts and Pratics., Prentice Hall, London'
2. Clements. J.P. and Gide Jack. (2006), Effective Project. Management, Thomson., South – Western.
3. Gray. B.C and Laeson. E.W. (2007), 'Project Management – the Managirial Process., 3rd Ed., MeGraw – Hill., New Delhi.

4. Wyzeeki. R.K and McGray.R., (2005), Effective Project Management 3rd Ed., Wiley Dreamtask., India.

**ඇගයීමේ ක්‍රමය:**


| | |
|---|---|
| අඛණ්ඩ ඇගයුම් සඳහා | 40% |
| (අ) පන්ති කාමර පරීක්ෂණ | |
| ක්ෂණික ප්‍රහේලිකා | |
| කණ්ඩායම් පැවරුම් | |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය ඉදිරිපත් කිරීම් | 20% |
| (ආ) මධ්‍ය සමාසික පරීක්ෂණය | 20% |
| අවසාන සමාසික පරීක්ෂණය | 60% |
| එකතුව | 100% |

**පාඨමාලා ඒකකය** : රාජ්‍ය කටයුතු පිළිබඳ ආර්ථික විද්‍යාව (Public Sector Economics)

**කේතය** : MAE 5201

**අර්ස ප්‍රමාණය** : 04

**කාලය** : පැය 60




**අභිමතාර්ථ**

1. වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක් තුළ රාජ්‍ය අංශයේ කාර්යභාර්ය ඇගයීම සහ රාජ්‍ය අංශයේ ගැටළු සම්බන්ධයෙන් ආර්ථික විශ්ලේෂණය භාවිතා කිරීම පිළිබඳ අත්දැකීම් ඉදිරිපත් කිරීම.
2. වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක් තැළ වෙළෙඳපොළ අසමත්වීමේ හේතූන් සහ ඒ හා සම්බන්ධ ගැටළු පිළිඉඳ පුළුල් දැනුමක් ලබා දීම.
3. රාජ්‍ය අංශයේ ප්‍රතිපත්ති තීරකයන් විසින් මුහුණ දෙනු ලබන ගැටළුවල ස්වරූපය පිළිබඳ පුළුල් දැනුමක් ලබාදීම.
4. මෙම විෂය පිළිබඳව මෑතකාලීනව ඉදිරිපත් වී ඇති අධ්‍යයන පිළිබඳ විමර්ශනාත්මක ඇගයීමක් සහ අවබෝධයක් ලබාදීම.

## පාඨමාලා අන්තර්ගතය

1. රාජ්‍ය අංශය හඳුන්වා දීම, වෙළෙඳපොළ අසමත් වීම සහ රාජ්‍ය අංශයේ කාර්යභාරය, කාර්යක්ෂමතාව හා සාධාරණත්වය ගුණාංග.
2. පොදු භාණ්ඩ, පොදු හා මිශ්‍ර භාණ්ඩ, පොදු හා ස්වේච්ඡා සැපයීම.
3. තොරතුරු ගැටළු, පිරිවැය - වාසි විග්‍රහය සහ ඇගයීමේ ගැටළු.
4. රාජ්‍ය අංශයේ සේවා තුළ පොදු හා පෞද්ගලික නිෂ්පාදනය.
5. පොදු තේරීම පිළිබඳ ගැටළු, ජන්ද සහ සාමූහික තේරීම්.
6. බහුකරණය, බදුමූලධර්ම, ප්‍රායෝගික ගැටළු.
7. රාජ්‍ය අයවැය, අයවැය ක්‍රියාවලිය.
8. රාජ්‍ය ණය, ණය කළමණාකරණය.

## නිර්දේශිත කියවීම් :


1. Cullis, J., and Jones. P., (1988), Public Finance and Public Choice, Oxford University Press., 2nd Edition.
2. Ulbrich. H.H., (2003), Public Finance – in Theory and Practice., Thomson, South – Western.

3. Mmyles. G.D., (1995), Public Economics., Cambridge University Pres.

**ඇගයීමේ ක්‍රමය:**

| | | |
|---|---|---|
| අඛණ්ඩ ඇගයුම් සඳහා | | 40% |
| (අ) | පන්ති කාමර පරීක්ෂණ | |
| | ක්ෂණික ප්‍රහේලිකා | |
| | කණ්ඩායම් පැවැරුම් | |
| | ශ්‍රව්‍ය දෘෂ්‍ය ඉදිරිපත් කිරීම් | 20% |
| (ආ) | මධ්‍ය සමාසික පරීක්ෂණය | 20% |
| | අවසාන සමාසික පරීක්ෂණය | 60% |
| | එකතුව | 100% |

**පාඨමාලා ඒකකය** : මූල්‍ය ආර්ථික විද්‍යාව

(Financial Economics)

**කේතය** : MAE 5202

**අර්ස ප්‍රමාණය** : 04

**කාලය** : පැය 60




## අභිමතාර්ථ

1. ප්‍රායෝගික මූල්‍ය වෙළෙඳපොළවල් ක්‍රියාත්මක වන ආකාරය පිටුපස පවතින න්‍යායාත්මක පදනම අවබෝධ කර ගැනීම.
2. වත්කම් මිල නියම කිරීම සහ තක්සේරු කිරීම සඳහා අවශ්‍ය වන තාක්ෂණික මෙවලම් පිළිබඳ අවබෝධයක් ලැබීම.
3. මූල්‍ය ආයෝජන ගොනු කළමණාකරණය පිළිබඳව අවබෝධය පුළුල් කිරිම.

## පාඨමාලා අන්තර්ගතය

1. මූල්‍ය ආර්ථික විද්‍යාව :

   හැඳින්වීම, මුදල් හා මුදලේ කාලානුරූප වටිනාකම්, සුරැකුම් වෙළෙඳපොළ සංවිධානය වී ඇති ආකාරය හා

ඒවායේ ක්‍රියාකාරීත්වය, කාර්යක්ෂම ප්‍රාග්ධන වෙළෙඳපොලවල්

2. ප්‍රසස්ත ආයෝජන කළඹ :

   ආයෝජන කළමණාකරණය පිළිබඳ හැඳින්වීමක්, (Markowit) මාකෝවිට්ස් කළඹ ආයෝජන න්‍යාය, වත්කම් මිල නියම කිරීම පිළිබඳ ආදර්ශ, ප්‍රතිලාභ අවදානම පිළිබඳ බහු සාධක ආදර්ශ.

3. මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය :

   මුදල් ප්‍රමාණ ප්‍රකාශන, මූල්‍ය අනුපාත විග්‍රහය, ද්‍රව්‍යශීලතාව, අවදානම්, වර්ධනය විභවතාව, අනුපාත විග්‍රහයේ සීමාකම්.

4. සුරකුම් තක්සේරු කිරීම :

   විකල්ප ආයෝජන ඇගයීම්, සාපේක්ෂ ඇගයීමේ යාන්ත්‍රණය, අභ්‍යන්තර ඵලතා අනුපාතය.

5. සාමාන්‍ය කොටස් විශ්ලේෂණය :

   කොටස් වෙළෙඳපොළ විශ්ලේෂණය, කර්මාන්ත විශ්ලේෂණය, සමාගම් විශ්ලේෂණය හා කොටස් ඇගයීම, තාක්ෂණික ඇගයීම, කළඹ ආයෝජන කළමණාකරණ උපායමාර්ග.

6. බැඳුම්කර වෙළෙඳපොළ :

බැඳුම්කර වෙළෙඳපොළ මූලිකාංග, බැඳුම්කර තක්සේරු කිරීම, බැඳුම්කර ආයෝජන ගොනු කළමණාකරණය.

7. ව්‍යුත්පන්න වෙළෙඳපොළවල් :

   මූලික ව්‍යුත්පන්න හා සුරැකුම්, ඉදිරි වෙළෙඳපොළ ගිවිසුම්, හුවමාරු ගිවිසුම්, පරිවර්තනය කළ හැකි සුරැකුම්.

## නිර්දේශිත කියවීම් :


1. Frank K. Reilly and Keith. C. Broun., (2003), Investment Analysis Portfolio Management, 2nd ed., Thomson, South – Western, USA.


### ඇගයීමේ ක්‍රමය:

| | |
|---|---|
| අඛණ්ඩ ඇගයුම් සඳහා | 40% |
| (අ) පන්ති කාමර පරීක්ෂණ | |
| ක්ෂණික ප්‍රහේලිකා | |
| කණ්ඩායම් පැවැරුම් | |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය ඉදිරිපත් කිරීම් | 20% |
| (ආ) මධ්‍ය සමාසික පරීක්ෂණය | 20% |
| අවසාන සමාසික පරීක්ෂණය | 60% |
| එකතුව | 100% |


**පාඨමාලා ඒකකය :** ලෝක ආර්ථික ප්‍රවණතා

(World Economic Trend)

**කේතය :** MAE 5203

**අර්ඝ ප්‍රමාණය :** 04

**කාලය :** පැය 60




## අභිමතාර්ථ

1. ජාත්‍යන්තර ආර්ථිකයේ තත්කාලීන වෙනස්කම් ආර්ථික විද්‍යා දෘෂ්ටිකෝණයකින් විමසා බැලීම.
2. ජාත්‍යන්තර ආර්ථිකයේ සිදු වන වෙනස්වීම් පිළිබඳව නිරන්තරයෙන් සිසුන් අවදියෙන් තබා ගැනීම.
3. ලෝක ආර්ථිකයේ සිදු වන වෙනස්වීම් ශ්‍රී ලංකාව හා කලාපීය ආර්ථිකයන්ට බලපාන ආකාරය අවබෝධ කර ගැනීම.

## පාඨමාලා අන්තර්ගතය

1. ව්‍යාපාර චක්‍ර :

   ලෝක ආර්ථික උත්පාත, අවපාත හා මෑතකාලීන සැපයුම් පාර්ශවීය කම්පනයන් ඇතුළත්ව ව්‍යාපාර චක්‍රවල හැසිරීම.
2. සංවර්ධනය :

ආර්ථික සංවර්ධනය, මානව සංවර්ධනය, දිළිඳුකම පිටු දැකීම, මානව හිමිකම් සුරක්ෂිත කිරීම, බුද්ධිමය දේපළ අයිතීන් පිළිබඳ ජගත් මට්ටමේ සංවාද.

3. ජනගහනය :

ශ්‍රම බලකාය, සේවා නියුක්තිය, ජාත්‍යන්තර ශ්‍රම විගමනය, බුද්ධිගලනය ආදී සංරචකයන්හි ව්‍යාප්තිය හා ව්‍යුහාත්මක වෙනස්වීම් හා එමඟින් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවත්නා රටවල් කෙරෙහි ඇති වන බලපෑම.

4. ජාත්‍යන්තර වෙළෙඳ රටාව :

කලාපීය ආර්ථික සහයෝගීතා සංවිධාන, කලාපීය වෙළෙඳ ගිවිසුම්, ද්වීපාර්ශවීය හා බහුපාර්ශවීය වෙළෙඳ හා ආයෝජන ගිවිසුම්වල නූතන ප්‍රවණතා (ASEN, SAARC, NAFTA, EU, CARICOM)

5. ජාත්‍යන්තර සංවිධාන :

ජාත්‍යන්තර සංවිධාන, ආධාර කණ්ඩායම්, ජගත් ආර්ථික මත ආර්ථික බලවතුන්ගේ සංවිධානවල බලපෑම, ලෝක බැංකුව (IBRD), ජාත්‍යයන්තර මූල්‍ය අරමුදල (IMF), ලෝක වෙළෙඳ සංවිධාන (WTO), එක්සත් ජාතීන්ගේ සංවිධානය (UN), G-7, G-8, OCED.

6. ජාත්‍යයන්තර ප්‍රාග්ධන ගලනය :

විදේශ ආධාර, ලෝක ණය, විදේශ ආයෝජන, සංවර්ධන ආධාර ආදී විවිධ මුහුණුවරින් සිදු වන ජාත්‍යයන්තර ප්‍රාග්ධන ගලනයන්හි නව ප්‍රවණතා, සිශානතිය සහ විනිමය අනුපාත මත ඇති කරන බලපෑම.

7. ජාත්‍යන්තර ගැටුම් :

   ලෝක ත්‍රස්තවාදය හා සාම ක්‍රියාමාර්ග ලෝක ආර්ථිකය මත ඇති කරන සාර්ව ආර්ථික බලපෑම්, රාජ්‍ය ණය, ණය කළමණාකරණය.

8. පරිසරය :

   ස්වභාවික සම්පත් කළමණාකරණය, පරිසර සංරක්ෂණය, තිරසාර සංවර්ධනය පිළිබඳ ජාත්‍යයන්තර සම්මුතීන්.

9. ගෝලීයකරණය.

## නිර්දේශිත කියවීම් :

1. වේගයෙන් වෙනස්වන ලෝක ප්‍රවණතාවලට සමගාමීව පරිශීලනය විය යුතු කියවීම් ද වෙනස්විය යුතු බැවින් මෙම පාඨමාලාව සඳහා නිරිදේශිත කියවීම් ඉදිරිපත් නො කෙරේ. පාඨමාලා ඒකකය ඉගැන්වෙන

විද්‍යාර්ථීන්ට අදාළ කියවීම් පාඨමාලා සම්බන්ධීකාරක විසින් C-1 පත්‍රිකාවේ දක්වනු ඇත.

## ඇගයීමේ ක්‍රමය:

| | |
|---|---|
| අඛණ්ඩ ඇගයුම් සඳහා | 40% |
| (අ) පන්ති කාමර පරීක්ෂණ | |
| ක්ෂණික ප්‍රහේලිකා | |
| කණ්ඩායම් පැවැරුම් | |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය ඉදිරිපත් කිරීම් | 20% |
| (ආ) මධ්‍ය සමාසික පරීක්ෂණය | 20% |
| අවසාන සමාසික පරීක්ෂණය | 60% |
| එකතුව | 100% |


ECONOMIC